කැලණිය අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2017

10 ශ්‍රේණිය | පුරවැසි අධ්‍යාපනය -1 | කාලය: පැය එකයි

නම:.......................................................................

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

1) "ප්‍රජාතන්ත්‍රවාදය යනු සියළු දෙනාටම අයිතිවාසිකම් හිමිවන පාලන ක්‍රමයක් යන අදහස ඉදිරිපත් කළේ,
i. ඒබ්‍රහම් ලින්කන් ය.  ii. සීලර් ය.
iii මහත්මා ගාන්ධි ය.  iv ජී. ඩී .එච්. කෝල් ය.

2) අතීතයේ සෘජු ප්‍රජතන්ත්‍රවාදී ලක්ෂණ පදනම් කොටගෙන පාලන කටයුතු වලදී තීන්දු තීරණ ගැනීමේ ක්‍රියාවලිය සිදු කළ රාජ්‍යයක් වන්නේ ,
i. ඇමෙරිකා එක්සත් ජනපදය  ii. මහා බ්‍රිතාන්‍යය
iii. ඇතැන්ස්  iv. ප්‍රංශය

3) 1931 ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය යටතේ ඡන්දය පාවිච්චි කිරීමේ වයස් සීමාව අවුරුදු 21 විය. මෙය අවුරුදු 18 දක්වා අඩු කරන ලද්දේ කුමන ආණ්ඩුව යටතේ ද?
i. 1959 බලයට පත් වූ ආණ්ඩුව  ii. 1970 බලයට පත් වූ ආණ්ඩුව
iii. 1947 බලයට පත් වූ ආණ්ඩුව  iv. 1977 බලයට පත් වූ ආණ්ඩුව

4) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ඡන්ද කොට්ඨාශ බෙදා වෙන් කිරීම සඳහා ප්‍රධාන නිර්ණායකය ලෙස භාවිතා කරනු ලබන්නේ,
i. ජාතිය හා ආගම  ii. භූමිය හා ජනගහනය
iii. ජාතිය හා භූමිය  iv. ග්‍රාමීය හා නාගරික

5) නියෝජන ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රම තුළ වුව ද ඡන්දදායකයාට ඇතැම් අවස්ථාවල දී සෘජුව පාලනයට සහභාගි වීමට ව්‍යවස්ථානුකූලව ඉඩ සලසා ඇත.එවැනි අවස්ථාවක් නම්,
i. ජනාධිපතිවරණය  ii. මහමැතිවරණය
iii. ජනමතවිචාරණය  iv. පළාත් සභා මැතිවරණය

6) ද්විපක්ෂ ක්‍රමයක් පවතින රටකට නිදසුනකි.
i. චීනය  ii. ශ්‍රී ලංකාව  iii. උතුරු කොරියාව  iv. ඇමෙරිකා එක්සත් ජනපදය

7) සමාජයේ සෙසු ජීවීන්ට හානියක් නොවන පරිදි තම සිතැඟි ඉටු කරගැනීම සඳහා පුද්ගලයාට සමාජයෙන් ලැබෙන ඉඩකඩ හඳුන්වන්නේ,
i. වගකීම යනුවෙනි.  ii. යුතුකම යනුවෙනි.
iii. නිදහස යනුවෙනි.  iv. අයිතිය යනුවෙනි.

8) කිසිදු අභ්‍යන්තර හෝ බාහිර බලවේගයක මැදිහත් වීමෙන් තොරව ජනතාව වෙනුවෙන් යෙදවිය හැකි අධිකාරී බලය,
i. රාජ්‍ය බලයයි.  ii. ආණ්ඩු බලයයි.
iii. විධායක බලයයි.  iv. ස්වාධිපත්‍යය බලයයි.

9) යුරෝපයේ ජාතික රාජ්‍යය බිහිවීම ආරම්භ වූයේ,
i. ක්‍රි.ව.14 වන සියවසෙන් පසුවය.  ii. ක්‍රි.ව.16 වන සියවසෙන් පසුවය.
iii. ක්‍රි.ව.15 වන සියවසෙන් පසුවය.  iv. ක්‍රි.ව.18 වන සියවසෙන් පසුවය.

10) රජයේ කැමැත්ත හා මහජන අපේක්ෂා ප්‍රායෝගික වශයෙන් ක්‍රියාවට නංවන නියෝජිතයා ,

i. රාජ්‍යයයි ii. ආණ්ඩුවයි. iii. විධායකයයි iv. ව්‍යවස්ථාදායකයයි

11) "රටක විවිධ ජාතීන් බිහිවුවද ඔවුන් එක් ජාතියක් ලෙස සැලකිය යුතු ය."යන අදහසින් බිහි වූ දේශපාලන සංකල්පය වන්නේ ,

i. ජාතික රාජ්‍යයයි. ii. මානව වාදයයි

iii. ලිබරල් වාදයයි. iv. ප්‍රජාතන්ත්‍රවාදයයි

12) පුරවැසියන්ගේ බාහිර චර්යාව පාලනය කිරීම සඳහා රජය මඟින් පනවනු ලබන රීති සමුදාය සරලව හඳුන්වන්නේ,

i. යුක්තිය යනුවෙනි. ii. නීතිය යනුවෙනි.

iii. සිරිත් විරිත් යනුවෙනි. iv. අධිකරණය යනුවෙනි.

13) රටක උත්තරීතර ලේඛනය මෙන්ම මූලික නීතිය ද වන්නේ,

i. මූලික අයිතිවාසිකම් ප්‍රඥප්තියයි. ii. දණ්ඩ නීති සංග්‍රහයයි.

iii. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි. iv. රජයේ ගැසට් පත්‍රයය.

14) ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය ක්‍රමයක රජය පාලන කටයුතු පවත්වා ගෙන යාම සඳහා ජනතාව සතු බලය ,

i. ස්වාධිපත්‍යය බලයයි. ii. පරමාධිපත්‍යය බලයයි.

iii. ව්‍යවස්ථාපිත බලයයි iv. ඒකාධිපති බලයයි.

15) මධ්‍යම ආණ්ඩුව සතු ව්‍යවස්ථාදායක විධායක හා අධිකරණ බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් ප්‍රාදේශීය ආණ්ඩු ඒකක වෙත පවරා දීම,

i. බලය බෙදා හැරීමයි. ii. බලය පවරා දීමයි.

iii. බලය නියාමනය කිරීමයි. iv. බලය විමධ්‍යගත කිරීමයි.

16) ස්විට්සර්ලන්තය තුළ ක්‍රියාත්මක වන ප්‍රාදේශීය ආණ්ඩු හඳුන්වන්නේ,

i. ප්‍රාන්ත නමිනි. ii. ෆෙඩරල් නමිනි

iii. ඒකීය නමිනි. iv. කැන්ටන් නමිනි.

17) පළාත් සභාවක නාමික විධායකය වශයෙන් පළාතේ මහ ඇමතිවරයාගේ උපදෙස් පරිදි ක්‍රියා කරනු ලබන්නේ,

i. සභාපතිවරයා ය. ii. ආණ්ඩුකාර වරයා ය.

iii. ලේකම්වරයා ය. iv. මන්ත්‍රීවරයා ය.

18) ඇමෙරිකා එක්සත් ජනපදයේ මධ්‍යම ආණ්ඩුව සතු බලතල හා ප්‍රාන්ත ආණ්ඩුවට හිමි බලතල පහතින් සටහන් කර ඇත. ඒ අනුව මධ්‍යම ආණ්ඩුව සතුව පවතින බලතල පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

A - බදු පැනවීම හා එක්රැස් කිරීම
B - මූල්‍ය කටයුතු
C - නිවාස ඉදිකිරීම
D - ජාතික ආර්ථික සංවර්ධනය
E - අධ්‍යාපනය හා සෞඛ්‍යය

i. ACD ii. ABD iii. ABE iv. AED

19) ශ්‍රී ලාංකික ජන සමාජය විවිධ සංස්කෘතීන්ට අයත් පුද්ගලයන් ගෙන් සමන්විත වුවත් ඔවුහු සියල්ලෝම ,

i. බෞද්ධයෝ වෙති. ii. සිංහලයෝ වෙති.

iii. ශ්‍රී ලාංකිකයෝ වෙති. iv. දමිළයෝ වෙති.



pastpapers.lk pdfelement Remove Watermark Now

Remove Watermark Now

20) A - වසර 2500 වඩා වැඩි දීර්ඝ ඉතිහාසයකට උරුම කම් කීම

B - ශ්‍රී ලංකාව ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයක් වීම

C - ශ්‍රී ලංකාවේ සාපේක්ෂ පිහිටීම

D - ශ්‍රී ලංකාව දූපතක් ලෙස පිහිටීම

ඉහත කරුණු අතරින් ශ්‍රී ලංකාව තුළ භාෂා හා ආගම් සනත්වය වැඩි රටක් වීම සඳහා බලපා ඇති කරුණු පහත පිළිතුරු අතරින් තෝරන්න.

i. A D ii. A C iii. A B iv. B C

21) එකම පාලන ව්‍යුහයක් තුළ විවිධ භාෂා කතා කරන විවිධ ආගම් අදහන විවිධ සිරිත් විරිත් අනුගමනය කරන පිරිස් සිටින සමාජයක් හඳුන්වන්නේ,

i. බහු වාර්ගික ii. බහු ජාතික iii. බහු සංස්කෘතික iv. බහු ආගමික

22) A - වැඩිම පිරිසක් අයත් වන සංස්කෘතියට අනුගතව කටයුතු කිරීම

B - සියළුම සංස්කෘතීන්ට ගරු කරමින් සමානව සැලකීම

C - විවිධ සංස්කෘතීන් මිශ්‍රවීම වැලැක්වීමට කටයුතු කිරීම

D - ජාතික සංවර්ධනය සඳහා ජනවර්ග අතර සහජීවනයෙන් යුතුව කටයුතු කිරීම

ඉහත කරුණු අතරින් බහු සංස්කෘතික ජන සමාජයේ පුරවැසියෙකුගේ වගකීම් වලින් දෙකක් පහත පිළිතුරු වලින් තෝරන්න.

i. AD ii. DC iii. BD iv, BA

23) 2012 ජන සංගනනය තුළ ආගම් අනුව ශ්‍රී ලංකාවේ ජන සංයුතිය පහතින් දක්වා ඇත. මෙහි ආගම් 'අ' තීරුවේ ද ප්‍රතිශතයන් 'ඉ' තීරුවේ ද සඳහන් කර ඇත. 'අ' සහ 'ඉ' තීරු නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| අ | ඉ |
|---|---|
| 1. බෞද්ධ | A 7.4% |
| 2. හින්දු | B 8.7% |
| 3. මුස්ලිම් | C 12.6% |
| 4. ක්‍රිස්තියානි | D 70.2% |
| 5. | |

i. DCBA ii. DCAB iii. DBAC iv. DBCA

24) බහු සංස්කෘතික ජන සමාජයක යහපාලනය ක්‍රියාත්මක වීමෙන් අත්වන වැදගත් ප්‍රතිඵලයකි.

i. රාජ්‍ය භාෂා කිහිපයක් භාවිතා කළ හැකි වීම

ii. ආගම් කිහිපයක් ඇදහීමට පුළුවන් වීම

iii. ආගමික හා සංස්කෘතික විවිධතා නොසලකා සහජීවනයෙන් කටයුතු කිරීමට හැකි වීම

iv. විවිධ සංස්කෘතීන් පිළිබඳව අවබෝධයක් ලබා ගත හැකි වීම

25) පරිසරය සම්බන්ධයෙන් පුරවැසියෙකු සතු යුතුකමක් වන්නේ,

i. තම අභිමතය පරිදි සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගැනීම

ii. පරිසරයේ සම්පත් අරපිරිමැස්මෙන් භාවිතා කිරීම

iii. සිය පාරිභෝජන අවශ්‍යතා සඳහා බාධාවකින් තොරව සම්පත් භාවිතා කිරීම

iv. තම බුද්ධිය මෙහෙයවා නව සම්පත් පිළිබඳව ගවේශනය කිරීම

26) භාණ්ඩ නිෂ්පාදනය සඳහා වැඩිපුර යන්ත්‍ර සූත්‍ර යොදා ගැනීම

i. ශ්‍රම සූක්ෂම වේ. ii. ප්‍රාග්ධන සූක්ෂම වේ.

iii. යාන්ත්‍රීකරණය වේ. iv. ප්‍රාග්ධනය වේ.

papers.lk
pdfelement

27) ආර්ථිකයක නිෂ්පාදනය කරන භාණ්ඩ හා සේවා යොදා ගෙන මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටුකර ගැනීම ,

i. පරිභෝජනය වේ. ii. නිෂ්පාදනය වේ.
iii. බෙදා හැරීම වේ. iv. ගබඩා කිරීම වේ.

28) පවත්නා සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගනිමින් යම් භාණ්ඩයක් නිපදවීම හෝ සේවාවන් සැපයීම,

i. අවශ්‍යතා ඉටුකිරීම වේ. ii. ඵලදායිතාව වේ.
iii. කාර්යක්ෂමතාව වේ. iv. ගුණාත්මකභාවය වේ.

29) තම ආර්ථිකයට සමාජයට ගැලපෙන පරිසර හිතකාමී තාක්ෂණය ,

i. නවීන තාක්ෂණය ලෙස හඳුන්වයි. ii. යෝග්‍ය තාක්ෂණය ලෙස හඳුන්වයි.
iii. යාන්ත්‍රීකරණය ලෙස හඳුන්වයි. iv. නිර්මාණශීලීත්වය ලෙස හඳුන්වයි .

30) කිසියම් රටක් තම රටට අවශ්‍ය භාණ්ඩ හා සේවා විදේශ රටවලින් ලබා ගැනීම හඳුන්වන්නේ,

i. ආනයනය ලෙසය. ii. භාණ්ඩ හුවමාරුව ලෙසය.
iii. අපනයනය ලෙසය. iv. විදේශ වෙළඳාම ලෙසය.

31) රාජ්‍ය පාලන බලතල ජනතාව විසින් තෝරා පත් කරන ලද නියෝජිතයන් මගින් ක්‍රියාත්මක කිරීම,

i. ඍජු ප්‍රජාතන්ත්‍රවාදයයි. ii. වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදයයි.
iii. ප්‍රජාතන්ත්‍රවාදයයි. iv. ව්‍යවස්ථානුගත ප්‍රජාතන්ත්‍රවාදයයි.

32) A - කැමති දේශපාලන පක්ෂයකට බැඳීමේ අයිතිය
B - ආණ්ඩුව විවේචනය කිරීමේ අයිතිය
C - ජීවත්වීමේ අයිතිය
D - වෘත්තීය සමිතිවලට බැඳීමේ අයිතිය

ඉහත සඳහන් අයිතිවාසි කම් වලින් දේශපාලන අයිතිවාසිකම් සඳහන් පිළිතුර තෝරන්න.

i. A,B හා C ii. AB හා D iii. A B හාE iv. B D හා E

33) සමානුපාතික නියෝජන ක්‍රමය ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කිරීම ආරම්භ වූයේ,

i. 1978 ව්‍යවස්ථාව අනුවය. ii. 1972 ව්‍යවස්ථාව අනුවය.
iii. 1947 ව්‍යවස්ථාව අනුවය. iv. 1931 ව්‍යවස්ථාව අනුවය.

34) ශ්‍රී ලංකාවේ වර්තමාන පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් ,

i. 196 කි ii. 250 කි. iii. 101 කි. iv. 225 කි.

35) ළමා අයිතිවාසිකම් හා ඒ හා බැඳුණු යුතුකම් පහත 'අ' සහ 'ආ' තීරු වලින් පෙන්වා ඇත.ඒවා නිවැරදි ලෙස ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| 'අ' | 'ආ' |
|---|---|
| 1. රැකවරණ ලැබීමේ අයිතිය | A - අන් අයගේ ජීවිත සුරැකීම |
| 2. මිතුරු සබඳතා පැවැත්වීමේ අයිතිය | B - ආගමික සහජීවනය |
| 3. ආගම ඇදහීමේ අයිතිය | C - වයසට ගැලපෙන නැණවත් මිතුරුඇසුර |
| 4. ජීවත් වීමට ඇත් අයිතිය | D - දෙමාපියන්ට වැඩිහිටියන්ට උදව් කිරීම |

i. D C A B ii. D C B A iii. D A C B iii. C B A D

36) පහත 'අ' තීරුවේ ආගම් ද 'ආ' තීරුවේ ආගම් හා බැඳුණු උත්සව ද පෙන්වා ඇත. 'අ' සහ 'ආ' තීරු නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| 'අ' | 'ආ' |
|---|---|
| 1. බෞද්ධ ආගම | A - දීපවාලී උත්සවය |
| 2. හින්දු ආගම | B - පාස්කු උත්සවය |
| 3. ක්‍රිස්තියානි ආගම | C - පොසොන් උත්සවය |
| 4. ඉස්ලාම් ආගම | D - රාමසාන් උත්සවය |

i. C A B D ii. A B D C iii. C A D B iv. A C B D

37) ශ්‍රී ලංකාවේ පළාත් පාලන ඉතිහාසය තුළ 'ගම්මුලාදෑනි' ක්‍රමය ක්‍රියාත්මක වූයේ ,

i. අනුරාධපුර යුගයේ ය.
ii. බ්‍රිතාන්‍ය යුගයේ ය.
iii. මහනුවර යුගයේ ය.
iv. නිදහසින් පසු යුගයේ ය.

38) රාජ්‍යයක පාලන කටයුතු මෙහෙය වන ප්‍රධාන ආයතනය ,

i. විධායකයයි.
ii. පාර්ලිමේන්තුවයි.
iii. කැබිනට් මණ්ඩලයයි.
iv. ආණ්ඩුවයි.

39) මහජනතාවට වඩාත් ඵලදායි හා කඩිනම් සේවාවක් සැපයීමේ අරමුණින් පළාත් පාලන ආයතනවලට හඳුන්වා ඇති සංකල්පය වන්නේ,

i. කාර්යක්ෂමතාව
ii. යහපාලනය
iii. සමානාත්මතාව
iv. ඵලදායිතාව

40) පළාත් සභා මැතිවරණයක දී ඡන්ද කොට්ඨාසයක් ලෙස සලකනු ලබන්නේ කවර පරිපාලන ඒකකයක් ද?

i. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය
ii. ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය
iii. දිස්ත්‍රික්කය
iv.පළාත

papers.lk
pdfelement
Remove Watermark Now

Remove Watermark Now
pdfelement
papers.lk

Remove Watermark Now

කැලණිය අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2017

10 ශ්‍රේණිය | පුරවැසි අධ්‍යාපනය - II | කාලය: පැය දෙකයි

නම:.............................................................

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

1. ප්‍රජාතන්ත්‍රවාදී ජීවන ක්‍රමයක ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.
2. නියෝජන ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් පවතින රටවල් දෙකක් නම් කරන්න.
3. යහපාලනයක මූලික ගුණාංග දෙකක් සඳහන් කරන්න.
4. ශ්‍රී ලාංකික ජනතාවට පාලනයට සම්බන්ධ වීමට ලැබෙන අවස්ථා දෙකක් නම් කරන්න.
5. ශ්‍රී ලංකාවේ ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කිරීම සඳහා භාවිතා කරන ප්‍රධාන නිර්ණායක දෙකක් නම් කරන්න.
6. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් පවතින රටක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව කටයුතු කිරීම නිසා ලැබෙන ප්‍රයෝජන දෙකක් නම් කරන්න.
7. ජාතික රාජ්‍යයක ප්‍රධාන ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.
8. සන්ධීය රාජ්‍යයක සාර්ථක පැවැත්ම සඳහා තිබිය යුතු ගුණාංග දෙකක් සඳහන් කරන්න.
9. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන දෙකක් නම් කරන්න.
10. ස්විට්සර්ලන්තය සන්ධීය රාජ්‍යයක් ලෙස ගොඩනැඟීම සඳහා බලපා ඇති හේතු දෙකක් සඳහන් කරන්න.

(ලකුණු20)

2).i. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක ප්‍රධාන ස්වරූප දෙකක් දක්නට ලැබේ. ඒවා නම් කරන්න. (ලකුණු 02)

ii. වර්තමාන ප්‍රජාතන්ත්‍රවාදී පාලන තුළද දැකිය හැකි සප්ත අපරිහානී ධර්ම තුනක් නම් කරන්න. (ලකුණු 03)

iii. ප්‍රජාතන්ත්‍රවාදය පාලන ක්‍රමයක් ලෙස වැදගත්වන ආකාරය කරුණු තුනක් මඟින් පෙන්වා ඉන් එකක් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 05)

3).i. ඒක පක්ෂ ක්‍රමය පවතින රටවල් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. තරගකාරී පක්ෂ ක්‍රමයක යහපත් ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

iii. නිදහස් හා සාධාරණ මැතිවරණයක ලක්ෂණ තුනක් සඳහන් කර ඉන් එකක් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 05)

4)i. යුරෝපයේ බිහි වූ ප්‍රථම ජාතික රාජ්‍යයන් දෙකක් නම් කරන්න. (ලකුණු02)

ii. ජාතික රාජ්‍යයන් බිහිවීමට බලපෑ හේතු තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

iii. ආණ්ඩුව සමන්විත වී ඇති ප්‍රධාන ආයතන තුනක් සඳහන් කර ඉන් එකක් පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 05)

5). i.ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීම කෙරෙහි බලපා ඇති හේතු දෙකක් නම් කරන්න. (ලකුණු02)

ii. ආර්ථිකය මන්දගාමී වීම හා සමාජ සාධාරණත්වය බිඳ වැටීමට බලපා ඇති හේතු තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

iii. බහු සංස්කෘතික සමාජයක යහ පාලනය ක්‍රියාත්මක වීම තුළින් අත්කර ගත හැකි වාසි තුනක් සඳහන් කර ඉන් එකක් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 05)

papers.lk pdfelement

6).i. සෘජු ප්‍රජාතන්ත්‍රවාදය වර්තමාන රාජ්‍යයන් තුළ ක්‍රියාත්මක නොවීමට හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

ii. ඡන්දකොට්ඨාස අනුව නියෝජිතවත් තෝරා ගැනීම නිසා අත්වන ප්‍රයෝජන තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

iii. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක විරුද්ධ පක්ෂය විසින් ඉටු කළ යුතු කාර්යය තුනක් නම් කර ඉන් එකක් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 05)

7) i.ව්‍යවස්ථාදායකය සතු කාර්යයන් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

ii. ජනාධිපති ආණ්ඩු ක්‍රමයක විශේෂ ලක්ෂණ තුනක් නම් කරන්න. (ලකුණු 03)

iii.ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් සාර්ථක වීමට අවශ්‍ය සාධක තුනක් නම් කර ඉන් එකක් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 05)

papers.lk